
ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත
LP - QD / 21/ News/ 2012

ක්‍රි. ව. 2012 අගෝස්තු 27 සඳුදා
04 වෙළුම - 44 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00

# ළමා ප්‍රදීපය




# තේවත්ත රෝගීන්ගේ මංගල්‍යය

## මෙවරත් බැතිබර දායකත්වය ඉහළින්

ලමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# අපේ කතෝලික උරුමය රැක ගනිමු.

**ආදරණීය දුවේ පුතේ...**

මේ පාසල් නිවාඩු කාලයේ හොඳින් සෙල්ලම් කරමින්. සරුංගල් යවමින් විනෝද වෙනවා නේද? ඒ විනෝද ජනක අත්දැකීම් මධ්‍යයේ අද මං දුවලා පුතාලා එක්ක අපේ කතෝලික උරුමය පිළිබඳව අදහස් බිඳක් බෙදා හදාගන්න බලාපොරොත්තු වෙනවා. උරුමය කියන්නේ දෙමාපිය ඥාති හිතවතුන්ගෙන් අපට ලැබෙන දෙයක්. එහෙනම් කතෝලික උරුමය කියන්නේ බෞතිස්ම ස්නාපනය ලැබීමත් සමග දේව පවුලට සම්බන්ධ වීම නිසා කතෝලිකයන්ට ලැබෙන සුවිශේෂී දෙයක්.

අපේ කතෝලික බව නිසාම ශුද්ධවූ කතෝලික සභාවේ සාමාජිකත්වය සඳහා උරුම හිමිකම් කීමට වරම් ලබන අතර මේ දේව දරුකම අපට දේව රාජ්‍යයට පිවිසීමේ මහඟු වරමක් ද වන්නේය. අපගේ ජීවිතය හා සම්බන්ධ මේ උරුම හිමිකම් වලට අමතරව කතෝලික සසුන් වීරාවලිය පුරා පවත්නා දේවල්වල උරුම හිමිකම් කියන්නට ද කතෝලිකයන්වූ අපට හැකියාව ලැබේ. මේ නිසාම අපි මේ උරුම හිමිකම් පිළිබඳව මඳක් විමසිලිමත් වෙමු.

අපේ කතෝලික උරුමය සියවස් ගණනාවක් ඈතට විහිද යන්නකි. දේශීය වශයෙන් ශ්‍රී ලංකාව තුළද, ජාත්‍යන්තර වශයෙන් විශ්ව සභාව තුළද පවත්නා ගිනිය නොහැකි තරමේ උරුම හිමිකම් රාශියක් පවතී. මේ උරුමයන් විටෙක විශ්වාසය හා බැඳී පවතින වත්පිළිවෙත්, ජන වන්දනා අභ්‍යාස, සුවිශේෂී ස්ථාන, ප්‍රාතිහාර්යයන් සිදු වු ස්ථාන ශුද්ධවූ ධාතු, නොදිරන සිරුරු , සාන්තුවර මහිමයේ නිහඬ සාක්ෂි ඇතුළත් ඉතා පුළුල් විහිදුනු ක්ෂේත්‍ර ගණනාවක් පුරා පැතිර පවතී. විටෙක ජනතාවගේ විශ්වාසය හා බැඳී පවත්නා පිළිවෙත් ද ඊට එක්වේ. සංස්කෘතික වටිනාකම් ද අමතක කළ නොහේ

අපේ කතෝලික උරුමයන් ඓතිහාසික වැදගත් කමකින් යුතු වන අතරේම ඇතැම් උරුමයන් එක්සත් ජාතීන්ගේ ලෝක උරුමයන් අතර වැජඹෙමින් පවතී. ඉපැරණි සිද්ධස්ථාන හා පූජාභූමිද - සුවිශේෂී සිතුවම්, ගෘහ නිර්මාණ ශිල්ප, ගොතික් ඌරුවේ දෙව්මැදුරු ආදියෙන්ද කතෝලික උරුමය ලොව අන් සියල්ල මැද ඉතා නිහඬ එහෙත් ප්‍රෞඪ හා සුවිසල් අන්දමින් නැගී සිටී. සිරිලක සුප්‍රකට අනුරාධපුර කුරුසිය වැනි ඓතිහාසික උරුම යන් මෙරට සාම්ප්‍රදායික විශ්වාසය පවා වෙනස් කරන්නට තුඩුදෙන නිසාම ඇතැම් අන්තවාදීන්ගේ උකුසු ඇසට ලක්ව තිබේ.

විශ්වීය සංවර්ධනය උදෙසා කතෝලික නිර්මාපකයන්ගේ හා විද්‍යාඥයන්ගේ නිපදවීම් සහ සොයාගැනීම් මෙන්ම කතෝලික අධ්‍යාපනයේ මහිම යෙන් ඇතිවූ ශිෂ්ටාචාරයේ ගුණ මහිම කෙසේ අමතක කරන්නද? කතෝලික සසුන් ඉතිහාසයේ මහා පහන් කණු බඳු චරිතාවලියේ උරුම හිමිකම් වලින් පමණක් සෑහීමකට පත්නොවී මේ උරුමයේ ජීවිතාලෝකයෙන් අපේ ජීවිත හැඩ ගන්වා ගැනීමට පිටුබලයක් ලබා ගැනීම ඉතා වටිනා වගකීමක් හා යුතුකමකි.

පුංචි ඔබේ වීරයන් බවට පත්වී සිටින චිත්‍රපට නළුවන් , පරිගණක ක්‍රීඩාවල චරිත ඉක්මවා ගිය යථාර්ථවාදී මිනිස් ගුණ සුවඳින් මෙලෝ ජීවිත සුවඳ ගන්වන සාන්තුවර - සාන්තුවරියන්ගේ ජීවිත ආදර්ශය මෙන්ම ජීවිත ගමන් මඟද කොයිකාටත් සවිබල අත් වැලක්ම වන්නේය. කතෝලික සභාව තාඩන පීඩනයන්ට ලක්ව දහම තහනම්ව තිබූ යුගයේ පටන් නොබියව සැබෑ ක්‍රිස්තු සාක්ෂිය සිය ජීවිතයෙන් ප්‍රකට කරන්නට උත්සුක වූ සාන්තුවරයන්ගේ මධ්‍යස්ථකමින් ජීවිත ජයගන්නට පුංචි ඔබට පමණක් නොව වැඩිහිටි අප කොයිකාටත් මහත් අත්වැලක් ලබාගත හැකිය.

ඒ නිසාම අපේ කතෝලික උරුමය දැන හඳුනා ගැනීමටත්, ඒ පිළිබඳව හොඳින් තොරතුරු අධ්‍යයනය කරමින් නොදන්නා අය දැනුම්වත් කිරීමටත් දූ දරු ඔබ සැම ළමා වියේදීම පියවරගන්නේ නම් එය මහත් මෙහෙවරක් හා අගය කටයුතු වැයමක්ම වන්නේය.

**ඔබ සැමට ජේසු පිහිටයි !**

ශිරාන් මෛත්‍රි
ඥානාර්ථ ප්‍රදීපය සහකාර සංස්කාරක

# සාන්ත තෝමස් අපෝස්තුළුතුමා සහ ඉන්දියාව

## මොංගෝලියාවේ වෙනත් ආගම්

ඉහතකී ධර්මදූතයන් ඉදිරිපත් කර ඇති වාර්තා අනුව මධ්‍යම ආසියාවේ මේ යුගයේ බෞද්ධ විහාර ඔවුනට හමුවී තිබේ. නෙස්ටෝරියන් කිතු දහම කොපමණ දුරට පැතිර ගොස් තිබුණේදයත් ඔවුන්ගේ පූජකයන්ට බදු සහන පවා රජුගෙන් ලැබී තිබේ. 1289 කුබ්ලයිඛාන් අධිරාජයා ක්‍රිස්තියානි සංස්කෘතිය සඳහා විශේෂ ආයතනයක් ද පිහිටුවා ඇත. මොංගෝලි ඛාන් රජුගේ රාජ සභාවේ ප්‍රංශ, ජර්මන්, හංගේරි, ස්ලාව් , තුර්කි, පර්සියන් යන මේ වාර්ගික නියෝජිතයන් සිටි බව සඳහන් වේ. බටහිර රටවලට නුපුරුදු කඩදාසි මුදල් නෝට්ටු ඔවුන් භාවිත කර තිබේ. අපේ විවිධාකාර ඇදහිලි ඇති පරිදි , තම රටේ ද ජනතාවට කැමති ආගමක් ඇදහීමට ඉඩ දිය යුතුය යනු අධිරාජයාගේ මතය විය.

වැනිසියානු වෙළෙන්දකු වූ මාර්කෝ පොලෝ ගමන් කරුවාට චීනයේදී නෙස්ටෝරියන් ජන කොටස් හමුවී ඇත. එසේම ප්‍රන්සිස්කානු මොන්ටෙකෝර්විනෝ මොංගෝලියාවට එද්දී එහි නෙස්ටෝරියන් අගරදගුරුතුමකු සිටි බව ප්‍රකාශ කර තිබේ. 13 වැනි සිය වසරේ අවසාන භාගයේදී මොංගොලි කුමරුන් කතෝලික ධර්මය වැළඳගත් බවත්, මේ නිසා නෙස්ටෝරියන් පූජකයන් කෝර්විනෝ පියතුමාට දොස් නැගූ බවත් සඳහන් වේ.

## කිතුනු ඉතිහාසය ඉගෙන ගනිමු

## සිරිලක් කිතු සසුන



ගරු තිමති කොළමුන්නේ පැ.තු.නි. පියතුමා

13 වැනි සිවසේ අවසාන භාගයේදී මොංගෝලි අධිරාජයාගේ සොහොයුරෙක් සියලුම මුස්ලිම් ජනකොටස්වලට එරෙහිව ප්‍රහාරයක් අරඹා පර්සියාව දක්වා මැද පෙරදිග රටවල් කීපයක් ආක්‍රමණය කර තිබේ. මෙවැනි තර්ජන හා ඝාතන නිසා ධර්මදූත කණ්ඩායම් වල තිබුණු උනන්දුව පහළ බැස්සේය. 05 වැනි ක්ලමන්ට් පාප්තුමා ද, 1318 දී 22 වැනි ජෝන් පාප්තුමා ද ඉහතකී ධර්මදූතයන් දිරිගැන්වූ අය වූහ.

## ලංකාවේ ආදිකාලීන ඇදහිලි

ඉන්දියාවේ අශෝක රජ (ක්‍රි.පූ. 274-237) මිහිදු මහ තෙරුන් යටතේ ලංකාවට එවූ බෞද්ධ ධර්මදූත පිරිස මගින් දේවානම්පියතිස්ස රජු බුදු දහම වැළඳ ගත්තේය. ඉන්පසු එම රජතුමා තම ජනතාවටද බුදුදහම හඳුන්වා දුන්නේය.

මේ අනුව ලංකා ඉතිහාසය බෞද්ධ ඉතිහාසමය කථාවකි ජාත්‍යාලය ඇති බෞද්ධ භික්ෂූන් රටේ සුභ සිද්ධිය සඳහා වැඩ කළ හෙයින් සිංහල ජාතියත් බෞද්ධ ශාසනයත් එකක් බවට පත්විය. ක්‍රි.පූ. 02 වැනි සියවසේදී, ඉන්දිය සේන - ගුත්තික යන දෙමළ ජාතිකයින් ලංකාවේ උතුරු ප්‍රදේශය ආක්‍රමණය කළ බව පාලි ධර්මකතාවේ සඳහන් වේ. ක්‍රි.ව. 07 වැනි සියවසෙන් පසුව ද, ඉන්දීය පාණ්ඩවයන් ලංකාව ආක්‍රමණය කර තිබේ. 01 වැනි පරාක්‍රමබාහු රජතුමා ඉන්දියානු යුද්ධවලට පැටලී ඇත. එහෙත් 10 වැනි සියවස වනතුරු මෙරට දෙමළ සිංහල ජාතීන් භේද භින්න නොවී සිටි බවත් ඔවුනොවුන් අතර ආවාහ විවාහ සිදුවුණු බවත් ආචාර්ය ජී.සී. මෙන්ඩිස් මහතා පවසයි. 11 වැනි සියවසෙන් පසුව ලංකාවට කඩා වැදුණු චෝල ආක්‍රමණ පිරිස් නිසා ලංකාවේ උතුරු ප්‍රදේශයේ ද්‍රවිඩ ජනකොටස් පදිංචි වී තිබේ.

13 වැනි සියවසේ ඉන්දියාවේ කාලිංග මාඝ ලංකාවේ උතුරු ප්‍රදේශයේ ස්වරාජ්‍යයක් පිහිටුවා ගත්තේය. මේ අනුව දකුණු සිංහලයෝ බෞද්ධාගම ද උතුරේ දෙමළ ජනයා හින්දු ආගම ද ඇදහූහ. 13 වැනි සියවසේ අවසානයේදී ද, ඉන්දියානු ආර්ය චක්‍රවර්තිගේ බලය අවුරුදු 20 ක් ලංකාවේ දක්ෂිණ ප්‍රදේශය තුළ විහිදිගොස් තිබේ. 16 වැනි සියවසේ පෘතුගිසීන්ගේ පැමිණීමෙන් පසුව, ඉන්දිය සයුරේ බලය ඔවුන් අතට පත්වීම නිසා දකුණු ඉන්දියානු බලපෑම්, ආක්‍රමණ පෙර පරිදි ලංකාවට ඇති නොවීය. ක්‍රිස්තු පූර්ව යුගයේ ලංකාවේ පැවැති ආගම් පිළිබඳ විශ්වාස බොහෝ විට මිථ්‍යා කථා අනුව සකස්වී තිබේ. යකුන් ඇදහීම් දේශිය දෙවිවරුන්ට වන්දනාව මේවා අතරවූ ආගම් විය. මහා වංශය වැද්දන් හඳුන්වන්නේ යකුන් අදහන මිනිස් පිරිසක් වශයෙනි. රිග්වේද යුගයේදී (ක්‍රි.පූ. 1900 -1500) අසුර නමින්ද , රාමායන, මහා භාරත යුගයේදී රාක්ෂක නමින්ද, මහවංශ යුගයේදී යක්ෂ නමින් ද හැඳින්වුනේ දේශිය ආදි ගෝත්‍රික ජනයා විය හැකි බව මහාචාර්ය විමල විජයසූරීන්ගේ මතයයි බුදු දහම පැමිණීමෙන් පසු ඉතිරිවූ යක්ෂයන් ලංකාවේ ලග්ගල ප්‍රදේශයේ විසූ බව රාජාවලිය සහ සිංහල වංශ කථාවල සඳහන් වේ. මහාවංශය අනුව යකුන්ගේ රාජධානියක් වශයෙන් තිබුණේ ලංකාගිරි හෙවත් ලග්ගලයි.

### ලක්බිමේ කතෝලික ඉතිහාසය

ආදර දුවේ පුතේ, ලක්දිව කිතු සසුන ගැන කෙටි හැඳින්වීමක් මේ මස තුළ ඔබ අතට පත් වෙනවා. සැප්තැම්බර් මස සරලව ලියැවෙන ලක් දිව කිතු සසුන ගැන අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් විශ්‍රාමික අගරදගුරුතුමා ගෙන එන ලිපි පෙළ ''ළමා ප්‍රදීපය '' සතිපතා ගෙන එනවා.

ලක්බිම කතෝලික ඉතිහාසය නමින් පාඩම් පෙළ පොතක් සේ එය ඔබ අතට පත් වන නිසා එම පාඩම් පෙළ එකතු කරන්න. කියවා දැන ගන්න. සහ ඉතිහාසය නිවැරදිව අවබෝධ කර ගන්න.

සංස්කාරක පියතුමා

# ඔබේ අනාගත බලාපොරොත්තුව ?....




ආදරණීය දුවේ , පුතේ,

ඔබේ ජීවිතයේ අනාගත බලාපොරොත්තුව කුමක්ද? මේ පැනය බොහෝ දෙනෙකුගෙන් විමසූ විට ලැබෙන පිළිතුර වන්නේ ඉංජිනේරුවෙක් වීම වෛද්‍යවරයකු වීම , ගුවන් නියමුවකු වීම ගුරුවරයකු වීම වැනි විවිධ පිළිතුරුය. එහෙත් මෙහිදී අප මතකයේ තබා ගත යුතු වැදගත් කරුණක් පවතිනවා.

අප සියලු දෙනාටම වෛද්‍යවරුන් විය නොහැකි බව අප සියලු දෙනාටම ඉංජිනේරුවන් විය නොහැකි බව, මේ සමාජය පවතින්න. ඉදිරියට පවත්වාගෙන යන්න නම් කම්කරු වෘත්තියේ සිට පරිපාලන නිළධාරියා දක්වා සැම වෘත්තියක්ම වැදගත් වෙනවා. කුමන වෘත්තියේ යෙදුනත් අපි සැම පුද්ගලයකුම ගරු කළ යුතුයි. පිළිගත යුතුයි. කුඩා කල සිට අප මේ සඳහා පුරුදු පුහුණු විය යුතුයි.

උද :- ඔබේ නිවසේ වතුර මෝටරය අක්‍රිය වුවහොත් , කාර්මික දෝෂයක් මත විදුලිය විසන්ධි වුවහොත් , ඔබේ එදිනෙද සාමාන්‍ය වැඩ කටයුතු අවුල් වීමට හේතුව ක් වෙනවා නේද, මෙබඳු අවස්ථාවකදී අනිවාර්යයෙන්ම කාර්මික නිළධාරි මහත්මයකුගේ සහය අනිවාර්යයෙන්ම අවශ්‍ය වෙනවා නේද?.

එද ජේසුස් වහන්සේ මිනිසුන්ගේ සහ දෙවිඳුන්ගේ ප්‍රසාදය ලබමින් කායිකව සහ මානසිකව වැඩි වර්ධනය වුවා සේ අපද දෙවිඳුන්ට ප්‍රසන්න ලෙස ජීවිතය ගත කරමින් ශක්ති පමණින් අපේ දක්ෂතා කුසලතා දියුණු කරගෙන අන් අයටද සේවයක් කිරීමට උත්සහ කළ යුතුය. විවිධ විෂය ධාරාවන් තෝරා ගැනීමේදී අපේ කැමැත්ත ආශාව වගේම දක්ෂතාවයන් ඇති විෂය ධාරාවන් තෝරා ගත යුතුය. මේ තුළින් අපට සාර්ථක ප්‍රතිඵල ලබා ගන්න පුළුවන්. මේ නිසා ආදර දුවේ පුතේ, ඔබේ හැකියාව සහ ලැදියාව එකට එකතු වුවහොත් ඔබට අති විශිෂ්ටයකු වීමේ හැකියාව පවතිනවා.

එහෙත් මෙහිදී මතකයේ තබා ගත යුතු වැදගත් කරුණක් පවතිනවා. ඔබ කුමන ආකාරයේ විශිෂ්ටයකු වුවත් ඔබ යහපත් අයකු විය යුතුය. ඔබ අනෙක් අයට ආදරය කළ යුතුය. ඔබ අනෙක් අයට සේවය කළ යුතුය. එසේ නොවුවහොත් ඔබේ විශිෂ්ටත්වයෙන් පලක් නොවේ.

**ජී.ඒ. නිමාලි ප්‍රනාන්දු ගුරු මව**

## පාසල් නිවාඩුවෙන් උපරිම ප්‍රයෝජන ගනිමු

දැන් අපට පාසල් නිවාඩුව ලැබී තිබේ. එම නිවාඩුවෙන් ගත හැකි ප්‍රයෝජන කිහිපයක් මෙසේ දක්වමු.



- උදේ , සවස, දෙවිඳුන්ට යාච්ඤා කිරීම සහ ගීතිකා ගැයීම
- දවල් කාලයේ අම්මට උදව් වීම
- කලින් වාරයේ කළ පාඩම් යළි බලා ගැනීම
- ගෙදර දොර පිරිසිදු කිරීම
- ක්‍රීඩා කිරීම සහ විනෝද වීම

**ශෙනායා ප්‍රනාන්දු**
**3 ශ්‍රේණිය**
**ශුද්ධවූ පවුලේ කන්‍යාරාමය - බම්බලපිටිය**

**ඔබ පාසලේ, දහම් පාසලේ ඇති ළමා සමිති සමාගම් පිළිබඳව තොරතුරු පළ කිරීම සඳහා එම සමිතියේ තොරතුරු, නිලධාරි මඬුල්ලේ නම් ගම් ද ඇතුළත් කොට සමූහ සේයාරුවක් සමඟින් විස්තර**




**"අපේ සමිතිය",**
**ළමා ප්‍රදීපය,**
**අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත,**
**කොළඹ 08.**
**යන ලිපිනයෙන් අප වෙත යොමු කරන්න.**



ගම්පහ සිරිකුරුස දහම් පාසලේ ළමුන් 43 දෙනකු පසුගියද ප්‍රථම වරට දිව බොදුන් ලැබීය. ගම්පහ සිරි කුරුස දෙව්මැදුරේ පැවති දේව මෙහෙය සා. ඇලෝසියස් කනිටු දෙව්සත්හලේ භාණ්ඩාගාරික ගරු බර්ට්‍රම් ජයනාත් හා ගම්පහ ශාන්ත පීතර විදුහලේ ප්‍රාථමික අංශභාර ගරු ප්‍රදීප් කුමාර යන පියතුමන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වුනි. ගම්පහ මීසම් සේවක ගරු කිංස්ලි අයිවන් පියතුමාගේ අනුශාසකත්වයෙන් මෙදින කටයුතු සංවිධානය කෙරීනි. දිව බොදුන් ලැබූ ළමුන් ගරු පියතුමන් පැවදි සොයුරියන් හා දහම් ගුරු භවතුන් සමග ළමා ප්‍රදීපය සඳහා සමූහ සේයාරුවකට පෙනි සිටි අයුරු. **(ඩොමිනික් පෙරේරා)**



# පළමු වරට දිව බොදුන් ලැබීම



එඬේරමුල්ල සා. සෙබස්තියන් දහම් පාසලේ ළමුන් 75 දෙනෙකු වෙත පළමුවරට දිව්‍ය සත්ප්‍රසාද දනය කිරීම දෙව්මැදුරේදී සිදු කෙරිණි. මීසම් සේවක ගරු ප්‍රසන්න රොහාන් පියතුමාගේ ප්‍රධානත්වයෙන් හා ගරු කමල් කුමාර පියතුමාගේ අධීක්ෂණයෙන් පැවැත්වුණි. **(පැට්රික් පෙරේරා)**

ග්‍රෑන්ඩ්පාස් ශු. ජුසේ මුනිඳුන්ගේ දේවස්ථානයේ ළමුන් 85 දෙනකු පසුගියද පළමු වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූහ. එය මීසම් සේවක ගරු ආනන්ද ප්‍රනාන්දු පුල්ලේ පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. දහම් පාසලේ ගරු විදුහල්පතිනී පැවදි සොයුරිය හා දහම් පාසල් ගුරුවර ගුරුවරියන්ගේ සහයෝගයෙන් මෙදින කටයුතු සංවිධානය කෙරිනි. දිව බොදුන් ලැබූ ළමුන් මීසම් සේවක පියතුමන් හා මෙදින සහභාගි වූ දහම් ගුරුභවතුන් සමග සේයා රුවකට පෙනී සිටි අයුරු. **(ගිහාන් ඈන්තනි)**



# 2012 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## පියාට ද මවට ද ගෞරව කරන්න.

★ **තීතස් 3/1,2 පාඨයට අනුව පාලකයින්ට පැවරෙන වගකීම් මොනවා ද?**

- නිලධාරීන්ට හා ආණ්ඩු බලය ඇත්තන්ට යටත් වී කීකරු වීම
- කිසිවෙකු ගැන අගුණ නොකීම
- සියලු යහපත් වැඩට සූදානම්ව සිටීමට සෙනඟට මතක් කිරීම
- කලහකාරී නොවී සියලුම මනුෂ්‍යයන් කෙරෙහි හැම අයුරින්ම කාරුණිකව ආචාරශිලීව සිටීම.

★ **සදාචාර සම්පන්න සමාජයක් බිහි කරන්නට යන ගමනේ දී පරිපාලන කටයුතු කරන පාලකයන් සතු වගකීම් කවරේ ද?**

- තම නායකත්වය තුළ පැවරෙන වගකීම් අවංකව නිසි අයුරින් ඉටු කිරීම
- තමන්ගෙන් රටට වියයුතු සේවාව නොපිරිහෙලා ඉටු කිරීම
- තමන්ගෙන් සේවය ලබන පුරවැසියන්ට සාධාරණය ඉටුකිරීම හා කාරුණික වීම
- සමාජයෙන් ලැබෙන පැසසුම් ගෞරවය මත සේවය නොකිරීම
- තම සේවය අවැසි සැම විටම සේවයට වැයවීම
- සභා නායකයින් හා එක්ව තම නායකත්වයේ ගමන යහපත් කරගැනීම

**✍ ගරු ඩේමියන් පෙරේරා පියතුමන් විසිනි.**

★ **සදාචාර සම්පන්න සමාජයක් බිහි කරන්නට යන ගමනේ දී පරිපාලන කටයුතු වලට සහය වන පුරවැසියන් සතු වගකීම් කවරේ ද?**

- තම වැටුපට පමණක් වහල් නොවී සේවය අවංකව ඉටු කිරීම
- පාලකයන්ට ගරු කිරීම හා අවනත වීම
- දෙවියන් හමුවේ පාලකයන් වෙනුවෙන් යාච්ඤා කිරීම
- නියමිත ලෙස බදු ගෙවීම
- පාලකයන් අගය කළයුතු තැන්හි අගය කර ඔවුන්ගේ සේවයට සහයවීම

★ **සිව්වන දේව පනතට විරුද්ධව අප සිදුකරන පාප කවරේද?**


- දෙමව්පියන්, වැඩිහිටියන් නොසැලකීම, ඔවුන්ට අගෞරව කිරීම
- මව්පියන් හුදකලා කිරීම
- මව්පියන්ට හිරිහැර කිරීම , පහරදීම බැන වැදීම
- ගුරුවරුන්ට වැඩිහිටියන්ට අකීකරු වීම , සිත් රිදවීම
- දෙමව්පිය වැඩිහිටියන්ගේ බලාපොරොත්තු කඩ කිරීම
- පොදු දේපල විනාශ කිරීම
- දෙමව්පියන්ගේ වස්තුව - දේපල විනාශ කිරීම
- තමන්ට පැවරී ඇති කටයුතු ඉටු නොකිරීම , මගහැරීම
- දෙමව්පියන් ලබාදුන් නිදහසින් අයුතු ප්‍රයොජන ගැනීම, ඔවුන් රැවටීම

## ජීවිතය විනාශ නොකරන්න

★ **පස්වන දේව පනත යනු කුමක්ද?**

- ජීවිතය විනාශ නොකරන්න
- පස්වන පනතින් අපට නියම වන්නේ අප අසල්වැසියාගේ ශාරීරික හා ආධ්‍යාත්මික යහපත ගරුකර ඔහු සමඟ සමාදානයෙන් ජීවත් වන්නටත්, අපගේම ශරීර සෞඛ්‍යය ගැන සැලකිලිමත් වන්නටත් ය.

# ඔබ පමණකි මා හට ඉන්නේ



කොපමණ මිතුරන් සිටියද මෙලොවේ
ඒ සැම සුළඟ ලෙසින් පහව ගියේ
නෙතු අද්දර කඳුළු බිඳුවක් තවරමිනි ....
නැවුම් දිනකට ඇරයුම් තබමින්
හිරු කුමරිය සැඳෑ යාමයේ
අඹරේ සැඟවෙන්නාක් සේ
නව පරමාර්ථයන් පොදි බැඳගෙන
පියමං කරන මේ ජීවන ගමනේ දී
හමුවන නෙක බාධක
සිත් හි නිදන් කරගෙන
හැඳින ගතිමි යථාර්ථයේ හඬ ......
නිහඬතාවය අබියස
හුදකලාව හා මුසු වු හද කට
දැනෙන්නාවු අපමණ සිතුවිලි
එකිනෙක විවර වනුයේ තනිකම හමුවේ
මංමුලා වූ විටකය ....
අවසන මා හට දෙවිදුනි ඔබ පමණක් මිස
අන් සරණක් නොවන වග හැඟෙනුයේ
හුදකලාවේ අඳුරු සෙවණැලි හද කුටියට
එබිකම් කරන විටකදීය .....

ඈන් දිනේෂිකා පෙරේරා
13 ශ්‍රේණිය (කලා අංශය) - සිරිකුරුස විදුහල ගම්පහ

# කලමුල්ලට තූර්ය වාදක කණ්ඩායමක් .....



කලමුල්ල මීසමට මෙතෙක් අඩුවක්ව පැවති තූර්ය වාදක කණ්ඩායම මීසම් සේවක ගරු මොරිස් නාමල් පියතුමාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කෙරිණි. ගරු පියතුමන්ලා ළමුන් පුරුදු පුහුණු කළ ගුරු මහත්ම මහත්මීන් ළමුන් සමග සමූහ සේයා රුවකට මුහුණ දුන් අයුරු.

**සටහන :- ඇන්ටන් ප්‍රනාන්දු සේයා :- ස්ටුඩියෝ රනිල්**

# ශ්‍රී ලංකා චෙස් පිල නියෝජනය කරමින් ජාත්‍යන්තර තරගාවලියකදි පදක්කම් දිනයි....



ශ්‍රී ලංකා චෙස් සංගමයේ හා ආසියානු චෙස් සම්මේලනයේ සහයෝගය ඇතිව පසුගියද හික්කඩුව ඡායා ට්‍රාන්ස් හෝටලයේදී පැවැති ආසියානු කනිෂ්ඨ චෙස් තරගාවලියේදී ශ්‍රී ලංකාවට කාන්තා කණ්ඩායම් තරගවලින් රිදී පදක්කම් 1 ක් සහ ලෝකඩ පදක්කම් 2 ක් සමගින් පදක්කම් 3 ක් දිනා ගැනීමට හැකි විය.

මෙහිදි 2012 ආසියානු යොවුන් චෙස් තරගාවලිය, ආසියානු යොවුන් අධිවේගී චෙස් තරගාවලිය , ආසියානු යොවුන් රැපිඩ් චෙස් තරගාවලියන්හිදි පිළිවෙලින් වයස අවුරුදු 10 න් පහල බාලිකා කණ්ඩායම් රිදි හා ලෝකඩ පදක්කම් දිනාගැනීමට ශ්‍රී ලංකා කණ්ඩායට සමත්වුනි. ශ්‍රී. ලංකා කණ්ඩායමට ක්‍රීඩා කළ මීගමුව ආවේ මරියා කන්‍යාරාමයේ ක්‍රීඩිකා රොෂෙල් නතාෂා ඇස්කි ශිෂ්‍යාව ලැබු පදක්කම් සමගින් ළමා ප්‍රදීපය සඳහා සේයාරුවකට මුහුණ දුන් අයුරු **(කුමර)**

# අවසරයි සමුගන්නට



**මාපිය අතැඟිලි වල දැවටී**
**පියනැඟුවා මතකයි ඔබ පා සෙවනට**
**පෙව්වා සිප් කිරි ඔබ මා හට**
**සිය මව් සෙනෙහස පාමින්**
**ගෙවුණා අම්මේ දහතුන් වසරක්**
**මටත් නොදැනීම රහසින්**
**හමුවුවා බොහෝ සොයුරියන් මාහට,**
**ඔබ තුරුලේ දැවටී ඉන්නා විට**
**ඔබ අතැඟිලි මත දැවටෙන විට,**
**නැත මා හට දැනුණේ කිසි තනියක්**
**තුති දෙමි අම්මේ දුන් සැමදේ හට**
**දිවියේ සොඳුරුම අවධියේ**
**මා හට පහන්ටැඹ වුයේ ඔබයි**
**ඔබ තුරුලේ උණුසුම ලබනට ඇත්තේ**
**තව එක වසරයි**
**එබැවින් මව්නේ අවසරයි ඔබෙන් සමුගන්නට**
**එළඹෙන නව වසරේ**

*වර්ජින් පෙරේරා*
*13 ශ්‍රේණිය (වානිජ අංශය) - ශා. බ්‍රිජට් කන්‍යාරාමය*
*කොළඹ 07*

ප්‍රමා ප්‍රදීපය

# ඔලිම්පික් පි

# කුරු

**ලන්ඩන් ඔලිම්පික් තරගාවලිය අවසන්ව සතියකුත් ගෙවී අවසන්. පාසල් නිවාඩු කාලය නිසා දූලා පුතාලා ඔලිම්පික් උන්මාදයේ දැවටුනා නේද? අවාසනාවකට වගේ අපේ රටෙන් තිස්වන ඔලිම්පික් තරගාවලියට සහභාගි වීමට ගිය ක්‍රීඩක ක්‍රීඩිකාවන් සත් දෙනාගෙන් කිසිවෙකුට සිය ඉසව්වෙන් අවසන් මහා තරගය දක්වාවත් පැමිණෙන්නට ලැබුණේ නැහැ. ඒ කොහොම වෙතත් ඔලිම්පික් පිටියේ රන්, රිදී, ලෝකඩ පදක්කම් තරගය මැද්දේ ඉතා නිහඬව එහෙත් අභීතව කුරුසියේ ලකුණ සළකුණු කරමින් දෙවියන් වහන්සේට තුති පුදන අයුරු තරග අවසානයන්හිදීත්, කුරුසියේ ලකුණ සනිටුහන් කරමින් තරගයට සාර්ථකව මුහුණ දීමට දේව වරප්‍රසාද අයදින අන්දම තරග ආරම්භයන්හිදීත් ඔබ දුටුවාද?**

තිස්වන ඔලිම්පික් උලෙළේදී ලන්ඩනය පමණක් නොව මුළු ලෝකයම කුල්මත් කළ උසේන් බෝල්ට්ගේ පටන් සුදු- කළු, උතුරු - දකුණු , ධනවත් - දුප්පත්, ආදි කවර හෝ බෙදීමකින් තොරව ඔලිම්පික් පිටියේදී කිතුනු බව ප්‍රකට කරන්නට බොහෝ දෙනෙක් උත්සුක වූහ. එපමණකින් සෑහීමකට පත් නොවී දේව වරප්‍රසාදයන්ට තුති පුදන්නටත්, දෙවියන් වහන්සේ ගැන මුළු ලෝකයටම ඇහෙන්නට කතා කරන්නටත් උත්සුකවූ ක්‍රීඩක ක්‍රිඩිකාවෝද වූහ.



**උසේන් බෝල්ට්**

බ්‍රසීලයේ කාන්තා වොලිබෝල් කණ්ඩායම ලන්ඩන් 2012 ඔලිම්පික් උලෙළේදී ඇමෙරිකා එක්සත් ජනපද කණ්ඩායම වට 3-1 පරාජය කරමින් රන් පද-ක්කම් දිනුවේය. ඒ සමගින් ඔවුන් සහභාගිවූ තරග දෙකින් සිය ජයග්‍රහණයේ සතුට කැටිකරගෙන පුහුණුකරුවන්ද සමගින් දණගසා 'ස්වර්ගයේ වැඩ සිටින' යාච්ඤාව ඉතා හැඟීම්බරව යාච්ඤා කළේ සෑම සියලු දෙනා තිගැස්මකට ලක් කරමිනි. මෙවර ලත් සිය ජයග්‍රහණය ගැන කතාකළ කණ්ඩායමේ ප්‍රධාන පුහුණු කරු ජෝස් රොබර්ටෝ ගයිමාරෙ මහතා වාර්තාකරුවන් අමතා ප්‍රකාශ කළේ කණ්ඩායමේ තවත් ජයග්‍රහණයක් ලැබෙතොත් මහා සන්තියාගො පුදබිමට පයින් යෑමට බාරයක් වී ඇතැයි ද දැන් එය ඉටුකිරීමේ කාලය උදවී ඇතැයිද යන්නය. මගේ ජීවිතයේ අන් කවරදකවත් යාච්ඤා නොකළ තරමට මං යාච්ඤා කළා මගේ බිරිඳ පැය තුනක් දෙව්මැදුරේ සිටිමින් යාච්ඤා කළා. ඒ යාච්ඤාවල ප්‍රතිඵල ඇස්පනා පිට දැක බලාගන්නට දෙවි මහෝත්තමයාණන් වහන්සේ මට අවකාශ සලසා දී ඇතැයි ඔහු නෙතග දිදුලන කඳුළු අතරින් පැවසීය.

ලන්ඩන් ඔලිම්පික් කරගාවලියේ කාන්තා පිහිනුම් ඉසව් අතර මීටර් 100 පසුපස ආර තරගයෙන් මෙවර මුල්තැන දිනා රන් පදක්කම තුරුළු කර ගත්තේ ඇමෙරිකා එක්සත් ජනපද යේ මිසී ප්‍රැන්ක්ලීන් ක්‍රිඩිකාවයි. ඇමෙරිකාවේ කෙළරාඩෝ ප්‍රාන්තයේ ජේසු නිකා රෙජිස් උසස් පාසලේ ඉගෙනුම ලබන මිසී මෙවර තරගයේදී පිහිනුම් ඉසව්වෙන් රන් පදක්කම් 4 ක් හා ලෝකඩ පදක්කමක් දිනා තරගාවලියේ වැඩිම පදක්කම් දිනූ ක්‍රීඩිකාව වූවාය. ඇයට වඩා වැඩි පදක්කම් දිනුවේ පදක්කම් හයක් දිනූ මයිකල් පෙල්ප්ස් පමණි. මගේ විශ්වාසය පුදුමා කාර ලෙද වැඩුණා.

දිනපතා මං පාසලේ පල්ලියට ගොස් දෙවියන්වහන්සේ සමග කතා කරන්නට අමතක කළේ නැහැ. රෙජිස් උසස් පාසලේ පැවදි සොයුරියන් සමග බයිබලීය අධ්‍යයනයන්ට සහභාගී වීමෙන් මගේ විශ්වාසය වඩ වඩාත් ශක්තිමත් වුණි. මගේ ජීවිතයේ පුදුමාකාර වෙනස් වීමකට මේ තත්ත්වය හේතුවුණා. දැන් මා කටයුතු කරන්නේ මගේ විශ්වාසය තව තවත් ශක්තිමත් කර ගනිමින් දෙවියන් වහන්සේගේ කැමැත්තට යටත්ව උන්වහන්සේට සමීපවූ ජීවිතයක්. මිසී ප්‍රැන්ක්ලීන් තවම 17 හැවිරිදි යුවතියක්. එ නිසාම යළි සියරට ගොස් පාසල් යෑමට පටන් ගත් ඇය 2013 වසරේ දී විභාගයට පෙනී සිටින්නීය. මේ ආදි වශයෙන් ඔලිම්පික් තරගාවලියේ පදක්කම් ලාභීන් රැසක් කිතුනු කමට සාක්ෂි



**කාන්තා මී**
**ඉතියෝපි**
**දේවමාතා පි**

# ිටියේ නිහඬ සාක්ෂිය:
# සියේ සළකුණ




**ීටර් 5000 රන් පදක්කම දිනූ යාවේ මිසර්ට් ඩිෆාර් සදාසරණ ින්තූරයක් ඔසවා සතුටු කඳුළු හෙලූ අයුරු..**

දරමින් ඒ බැව් ප්‍රසිද්ධියේ ප්‍රදර්ශනය කරමින් හා ප්‍රකාශ කරමින් කටයුතු කරනු දක්නට ලැබුණි. මීළගට ඔබ හමුවේ ඉදිරිපත් කරන්නට මා තෝරා ගත්තේ කාලෝස් බෝල්වි හෙවත් ලිටුස්ගේ කතාවයි. ස්පාඤ්ඤයේ හොකී කණ්ඩායම සමඟ තිස්වන ඔලිම්පික් තරගාවලියට සහභාගීවූ කාලෝස් බෝල්වි තරගාවලිය නිමාවත් සමග ආපසු සියරට යන්නේ පූජකවරය සඳහා බෙල්ජියමේ දෙවිසත්හලකට ඇතුළත් වීමටය. උපතින් කතෝලිකයකු වුවද 2005 දී ඔහු සැබෑ විශ්වාසි කයකු බවට පත්විය.අප තරගාවලිය ආරම්භ කළේ ඉතාමත් අසීරුවෙන් - බාධක මැද්දෙයි. එක් ඉරිදවක දිව්‍ය පූජාවට ගිය මම දෙවියන් වහන්සේ සමග පොරොන්දුවකට එළඹුනෙමි. මෙවර ඔවුන් ඉතිහාසය අලුතින් ලියූ අතර අවුරුදු 21 පහළ කණ්ඩායමක් මුල්වරට පදක්කමක් දිනා ගැනීමෙ වරමද හිමිවිය. ඒ සමගම මගේ හෘදය සාක්ෂිය මට මොර ගැහුවා ලීටස් දැන් ඔබ නිදහස් දරුවෙක් ඔබේ කැමැත්ත ඉටු කරන්න කියා මට හැම විටම ඇහෙන්න ගත්තා. මට කතෝලික පූජකවරය ගැන හැඟීමක් ඇති වුණේ ඔලිම්පික් තරගාවලියට ඉස්සෙල්ලයි. දැන් ඒ කැඳවීමට මං උත්තර බඳින්න සූදානම් කාලෝස් පවසන්නේය.

මේ අතර ඇමෙරිකා ධාවන කණ්ඩායමේ ලෝපෙස් ලෙමොන්කො සූඩාන ජාතිකයෙකි. වයස අවුරුදු හයේදී සූඩානයේ ක්‍රිමටොන්ග් හි දිව්‍ය පූජාවට සහභාගි වෙමින් සිටියදී



**මිසී ෆ්‍රෑන්ක්ලින්**

කඩා වැදුණු සතුරු ගෝත්‍රික කණ්ඩායමක් ඔහු ඇතුලු දරුවන් ත්‍රස්තවාදී කඳවුරකට රැගෙන ගියේ බලහත්කාරයෙනි. මේ වධක කඳවුරේදී ළමා වියට ඔරොත්තු නොදෙන කටයුතු වල බලහත්කාරයෙන් යෙදවූ සෙසු පිරිමි දරුවන් අකාලයේ මිය යන අන්දම දුටු ලෝපෙස් ඇතුලු දරුවන් පිරිසක් කඳවුරෙන් පළා විත් කෙන්යාවට ගියහ. එහි සරණාගත කඳවුරක නොවිඳිනා දුක් විඳිමින් පුරා දස වසරක් ගත කරද්දී කතෝලික දයා සේවාවකින් පැවැත්වූ රචනා තරගයකින් ජයලබා සූඩානයේ අතුරුදන් වූ දරුවකු ලෙස ඇමරිකාවට ආවේය. දෙවියන් වහන්සේගේ අසමසම ප්‍රේමයත්, කරුණාවත් , මහත්වූ වරප්‍රසාද කන්දරාවත් මැද මාව විශ්වාසයේ දරුවකු ලෙස




උන්වහන්සේ තෝරා ගත්තා. කිසිදු වටිනාකමක් නැතිව කුලී හේවායකු ලෙස මරණයේ එළිපත්තේ සිටි මාව ඒ අඳුරු ඉසව්වෙන් ආලෝකයේ පාරාදීසයට ගෙන ආවේ උන් වහන්සේයි. උන්වහන්සේ මාව තෝරාගත්තා. විනාශයේ අඳුරු පත්ලට වැටෙන්නට නොදී මාව නිසි මං ගැන්වූයේ දේව ප්‍රේමය හා කරුණාවයි.

මේ ආදී වශයෙන් ඔලිම්පික් පිටිය සිසාරා රැව් පිළි රැව් දෙන සැබෑ කිතුනු ජීවිත සාක්ෂියේ නිහඬ හඬ ඉඟි කරනුයේ ලෞකීක ජයග්‍රහණ හා සාර්ථකත්වයන් සඳහා දේව වරප්‍රසාදයේ විපුල මහිමය ගැනයි. එය අපේ ජීවිත වලට නව ආලෝකයක් කරගත නොහැකිද?

**ශිරාන් මෛත්‍රී**

# ඉංග්‍රීසි පාඩම
# විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ)
# සිසු සිසුවියන් සඳහා

General English - Grammar Lessons by courtesy of ළමා ප්‍රදීපය

**ඉදිරිපත් කිරීම - මයිකල් ඇන්ජලෝ ප්‍රනාන්දු විසිනි.** **පාඩම් අංක** : 67

## Positive - Comparative - Superlative
## පිළිබඳ තවදුරටත්

අපි කතා කරමින් සිටියේ සංසන්දනය සඳහා යොදාගන්නා **Positive - Comparative - Superlative** යන වචන සෑදෙන හැටි ගැන. අපි **er** හෝ **est** එකතු කිරීමෙන් මේ වචන සාදාගන්නා හැටිත් **more** සහ **most** යොදා මේ වචන සාදාගන්නා හැටිත් කතා කළා. අපි ඒ ඔස්සේම ටිකක් දැනුවත් වෙමු.

සන්සන්දනය සඳහා more සහ most යෙදෙන වචන කීපයක් අපි ඉගෙන ගත්තා. අද එවැනි more සහ most යෙදෙන තව වචන කීපයක් ගැන බලමු.
මේකත් මතක තබාගන්න

***යම් positive වචනයක් අවසාන වෙන්නේ 'e' අකුරෙන් නම්, Comparative වචනෙ සඳහා 'er' යෙදෙන්නේනෑ. 'r' පමණයි යෙදෙන්නේ. ඒවගේම Superlative එකට 'est' යෙදෙන්නේ නෑ. 'st' පමණයි යෙදෙන්නෙ.***

**නිදසුන්**

postive | Comparative | Superlative

able (හැකියාව ඇති) | able**r** (වඩා හැකියාව ඇති)
able**st** (වඩාත්ම හැකියාව ඇති)
ample (විශාලවූ ) | ample**r** (වඩා විශාලවූ)
ample**st** (වඩාත්ම විශාලවූ)
brave (නිර්භීත) | brave**r** ( වඩා නිර්භීත)
brave**st** (වඩාත්ම නිර්භීත)
Feeble (දුර්වල) | Feeble**r** (වඩා දුර්වල)
Feeble**st** (වඩාත්ම දුර්වල)
Fine (කදිම) | Fine**r** (වඩා කදිම)
Fine**st** (වඩාත්ම කදිම)
Free (නිදහස්) | Free**r** (වඩා නිදහස්)
Free**st** (වඩාත්ම නිදහස්)
humble (නිහතමානී) | humble**r** (වඩා නිහතමානී)
humble**st** (වඩාත්ම නිහතමානී)
large (විශාල) | large**r** (වඩා විශාල)
large**st** (වඩාත්ම විශාල)
late (පමාවූ) | late**r** (වඩා පමාවූ)
late**st** (වඩාත්ම පමාවූ)
nice (ලස්සන/හොඳ) | nice**r** (වඩා ලස්සන)
nice**st** (වඩාත්ම ලස්සන)
noble (උතුම්) | noble**r** (වඩා උතුම්)
noble**st** (වඩාත්ම උතුම්)
Polite (ශීලාචාර) | Polite**r** (වඩා ශීලාචාර)
Polite**st** (වඩාත්ම ශීලාචාර)
Strange (අමුතු) | Strange**r** (වඩා අමුතු)
Strange**st** (වඩාත්ම අමුතු)
True (ඇත්ත) | True**r** (වඩා ඇත්ත)
True**st** (වඩාත්ම ඇත්ත)
White (සුදු) | White**r** (වඩා සුදු)
White**st** (වඩාත්ම සුදු)
Wise (ඥානවන්ත) | Wise**r** (වඩා ඥානවන්ත)
Wise**st** (වඩාත්ම ඥානවන්ත)

ඉහත සඳහන් වචන වලට යෙදී ඇත්තේ 'er' සහ 'est' නොව 'r' සහ 'st' බව පැහැදිලිව නිරීක්ෂනය කර අවබෝධ කරගන්න.

# මුද්දර ලෝකය



## හඳුනා ගනිමු

ශ්‍රීලංකා මුද්දර ඉතිහාසයේ ඊළඟ පරිච්ඡේදය ආරම්භ වනුයේ 6 වන ජෝර්ජ් රජු සමය ලෙස සැලකෙන 1936 සිට 1947 දක්වාවූ කාලයයි. ඒ අනුව 1937 මැයි 12 වනදා 6 වන ජෝර්ජ් රජුගේ මෞලි මංගල්‍යය වෙනුවෙන් මුද්දර 3 ක් ප්‍රථම වරට එළි දැක්වීය.

ජෝර්ජ් රජු හා එළිසබත් රැජිනගේ රුව සහිත රතු, නිල් හා කොළ යන වර්ණයන්ගෙන් සමන්විත සත 06 , 09 . 20 යන වටිනාකම් වලින් යුත් මුද්දර කාණ්ඩයකි එය. ඉහත කී එකම තේමාවකින් යුත් රටවල් කිහිපයක් එකවර නිකුත් කරන මුද්දර කාණ්ඩ පෙළට ශ්‍රී ලංකාව තම දයකත්වය ලබාදුන් දෙවන අවස්ථාව මෙය ලෙස සැලකේ.

1946 දෙසැම්බර් 10 වන දින නිකුත් කරන ලද දෙවන ලෝක යුද්ධ ජයග්‍රහනය සැමරීම සඳහා බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු මන්දිරය හා තේම්ස් නදිය පසුබිම් කරගත් 6 වන ජෝර්ජ් රජුගේ ශීර්ෂයේ ඉදිරිපස දසුන රැගත් එම මුද්දර දෙකෙහි වටිනාකම සත 06 හා සත 15 වශයෙන් සඳහන් වුනි. යටත් විජිත රටවල් කීපයක්ම එය තේමාකරමින් එකම ආරයේ මුද්දර නිකුත් කළ බැවින් පෙර දැක්වූ ‘ඔම්නිබස්’’කාණ්ඩයට ශ්‍රී ලාංකීය දයකත්වය ලබා දුන් තුන්වන අවස්ථාව එය ලෙස පිළි ගැනේ, මෙම මුද්දරය නිකුත් කිරීමේ තවත් විශේෂත්වයක් ලෙස සැලකෙන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රථම මුල් දින කවරයද එම මුද්දරය හා එදිනම බැඳී තිබීමයි.

බ්‍රිතාන්‍ය පාලනය යටතේ ශ්‍රී ලංකාවෙ-න් නිකුත් කරන ලද අවසාන මුද්දර පෙළ ලෙස සැලකිය හැකිවන්නේ 1947 නොවැම්බර් 25 වන දින නිකුත් වූ නව රාජ්‍ය ව්‍යවස්ථාවක් යන තේමාව පාදක කරගනිමින් නිකුත්වූ මුද්දර 04 යි. එහිදී රාජ්‍ය මන්ත්‍රන සභා මන්දිරය (සත 06) ශ්‍රීපාද කන්ද (සත 10) දළද මළිගය (සත 15) රුවන් වැලි සෑය (සත 25) දැක්වෙන සිතුවම් සහිත 6 වන ජෝර්ජ් රජුගේ ඉදිරි ශීර්ෂ රුව දැක්වුනි.




1937 මැයි 12 වන ද 6 වන ජෝර්ජ් රජුගේ මෞලි මංගල්‍යය වෙනුවෙන් නිකුත් වූ ජෝර්ජ් රජු හා එළිසබෙත් රැජිනගේ රුව සහිත මුද්දරය

1947 දී බ්‍රිතාන්‍ය පාලන සමය අවසන්වූවත් නිදහස් ශ්‍රී ලංකාව් 1953 වසරේ ජුනි 02 වනදා 2 වන එළිසබෙත් රැජිනගේ මෞලි මංගල්‍යය නිමිතිකොට එම රැජිනගේ ඉදිරිපස ශීර්ෂ රුව සහිත සත 05 ක වටිනාකම්-න් යුත් මුද්දරයක් නිකුත් කරනු ලැබුවේය 6 වන ජෝර්ජ් රජුගෙන් අනතුරුව බ්‍රිතාන්‍ය කිරුළ හිමිවූයේ 2 වන එළිසබෙත් රැජිනටය.

ඉන් අනතුරුව එතුමිය සිය රාජකීය සංචාරය අතරතුර ලංකාවට පැමිණීම නිමිතිකොට 1954 අප්‍රේල් 10 වනදා විශේෂ මුද්දරයක් නිකුත් කරන ලදී. ‘‘රජ පෙරහර’’ නම්වූ එම මුද්දරයේ පෙරහරක චිත්‍රය මත 2 වන එළිසබත් රැජිනගේ ශීර්ෂයේ පැතිකඩ රුවක් නිර්මාණය කර තිබිණි. ලා නිල් පැහැගත් එම මුද්දරයේ වටිනාකම සත 10 ක් විය. ශ්‍රී ලංකා මුද්දර ඉතිහාසයේ බ්‍රිතාන්‍ය රාජකීය වංශාවලිය මෙයින් නිමාවේ.

✍ සිරිල් පෙරේරා

# 5 ශ්‍රේණියේ ළමුන්ට ශිෂ්‍යත්ව වැඩමුළුවක්




නායකකන්ද මීසම් සේවක ගරු මහේන්ද්‍ර ගුණතිලක පියතුමාගේ මඟ පෙන්වීම හා මෙහෙය වීම යටතේ මරදාන ශාන්ත ජෝශප් විද්‍යාලයේ ආචාර්ය ජෝශප් පයස් මහතා විසින් සංවිධානය කරනු ලැබූ 2012 පහේ ශිෂ්‍යත්ව විභාග යට පෙනී සිටින ළමුන් සඳහා වැඩ මුළුවක් පසුගියදා නායකකන්ද දෙව්මැදුරු පරිශ්‍රයේදී පැවැත්වුණි.

මෙම වැඩ මුළුව මෙහෙයවූයේ දේශක විමලසිරි ගුරුගේ මහතාය. ඉතා සාර්ථකව පැවැත්වූ මේ වැඩමුළුවට ළමෝ 300 පමණ සහභාගිවී සිටියහ. ගරු මහේන්ද්‍ර ගුණතිලක පියතුමන් සහභාගි වූ දරුවන්ට ආදර්ශ ප්‍රශ්න පත්‍ර ලබා දුන් අයුරු ඡායාරූපයේ දිස්වේ. **ජූලියන් ගුණවර්ධන**



**ගමෙහි සුන්දරත්වය**
**මනීශ දිනාල්**
05 ශ්‍රේණිය
සාන්ත සෙබස්තියන් දහම් පාසල
විඩේරමුල්ල




**දිව්‍ය හෘදයේ ජේසුනි**
**අමන්දි රවිෂරි නානායක්කාර**
05 ශ්‍රේණිය
අප ස්වාමිදුවගේ දහම් පාසල - මාතර

## පුංචි අපේ චිත්‍ර පිටුව

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.



**කෙතක වැඩ කරන ළඳුන්**
**කසුන් තරිඳු ප්‍රසංග**
05 ශ්‍රේණිය
ජපමාල දේව මාතා දහම් පාසල
කුඩාමඩුවැල්ල ( තොඩුවාව මීසම )



**දිය ඇල්ලක්**
**චතුර තේෂාංජ ප්‍රනාන්දු**
04 ශ්‍රේණිය
සා. තෙරේසා දහම් පාසල - තල්විල




**මෝස්තරයක්**
**සිත්මල් උදන සිල්වා**
02 ශ්‍රේණිය
ශා. රෝගුස් දහම් පාසල
දැලතුර




**දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ**
**රමේෂිකා දිල්ශානි**
05 ශ්‍රේණිය
ශු. පවුලේ දහම් පාසල
මොරකැලේ (කිරිමැටියාන මීසම )



**ධීවර ජීවිතය**
**ටානියා ඉවැන්ජලී**
05 ශ්‍රේණිය
සාන්ත තෙරේසා දහම් පාසල
තිඹිරිගස්යාය




**සදාසරණ දේව මාතාවන්**
**කවිඳු ඉදුර මදුශාන්**
10 ශ්‍රේණිය
නිර්මල ආරෝග්‍ය දේවමාතා දහම් පාසල
පොල්ගහ අගාර
(දුනකදෙණිය මීසම )



# සුදුවර චරිතයක් හඳුනාගනිමු

# ශු. අගුස්තිනු මුනිතුමා

**ක්‍රි.ව. 354 නොවැම්බර් 13 වන දින උතුරු අප්‍රිකාවේ තර්ගාස් නැමති කුඩා වෙළෙඳ ග්‍රාමයේ දී උපත ලද මෙතුමාගේ පියා පැට්‍රිෂියස් නම් අන්‍යාගමිකයකු වූ අතර මව බැතිමත් කතෝලික කතක වූ ශු. මොනිකා තුමිය වූවාය.**



කුඩා කල සිටම ඉගැනිමට ඉමහත් රුචියක් දැක්වූ මෙතුමා තම ප්‍රාථමික අධ්‍යාපනය තර්ගාස් නුවරින් ද පසුව උසස් අධ්‍යාපනය කාර්තේජ් නුවරින් ද හදාරා එහි දී විශිෂ්ට ලෙස අධ්‍යාපනය හැදෑරූ අයෙකු විය. එහෙත් එහි දී ඔහු මැනිකියානු වේදභේදයේ මළපත්වලට හසු විය. තවද මේ කාලයේ සල්ලාල අශික්ෂිත ඇල්මක පැටලුණ අතර මෙය ඔහුගේ මවට ඉමහත් ශෝකාන්විත වේදනාවක් ගෙන දෙන අත්දැකීමක් විය. ඔහුට අවුරුදු 32 ක් වූ කල මිලාන් නගරයේ ප්‍රසිද්ධ පාසල් වල කතිකාචාර්ය ධුරය ලද අතර දිනෙන් දිනම වැඩි වර්ධනය වූ තම පුත්‍රයාගේ නරක පුරුදු දුරු ගැනීමට නොහැකිවූ මොනිකාතුමී ඔහු ලුහු බැඳ මිලාන් නගරයට ද ගියාය. එහිදී අගුස්තිනු ශු. අම්බ්‍රෝසිතුමාගේ දේශනයන්ට ඇහුම්කන් දී හදවත තරමක කම්පාවකට පත් කළ නමුත්, ඔහුගේ නපුරු අශිෂ්ට පුරුදු වල බැම්ම කඩා දැමීමට එය ප්‍රමාණවත් නොවීය.

මොනිකාතුමී ශු. අම්බ්‍රෝසිතුමා වෙත ගොස් ඇගේ පුත්‍රයා බේරා ගැනීමට උදව් කරන ලෙස ඉල්ලා කන්නලව් කළාය. ඈ කෙතරම් හැඬුවාද කීවොත් අම්බ්‍රොසිතුමා ද "මෙවැනි කඳුළු හෙළන විට පුතෙකුට නාස්ති විය නොහැකිය...." පැවසුවේය. ඔහුගේ මවගේ බලවත් භක්තිමත් ස්ථිර යාච්ඤා මගින් ශුද්ධාත්මයාණන්ගේ බලයෙන් ඔහු ක්‍රමයෙන් වෙනස් වූ අතර දිනක් හදිසි සිත්හැරීමක කතාන්දරයක් අගුස්තීනු ඇසූ විට , ඔහුගේ හදට එය තදින් ම කාවැදිණි. ඔහු පාලු වත්තකට ගොස් දීර්ඝ භයානක සිත් සමනයකට ගොදුරු විය. හදිසියේම ඔහුට හඬ ශබ්දයක් ඇසිණි. එනම් "රැගෙන කියවන්න යනුයි." මඳ සිහියෙන් මෙන් ඔහු නැගිට ඔහුගේ හැකුළුම් පොත" දිගහැර එය කියෙව්වේය. එමගින් ඔහුගේ සිත් හැරුනු අතර සිය මවවු මොනිකාතුමියගේ යැදුම් බලය තුළ වයස අවු. 33දී මෙතුමා ප්‍රසාද ස්නාපනය ලැබීය. අගුස්තීනු තුමාගේ සිත්හැරීම සිදුවී නොබෝ දිනකින් සිය මව තම පුත්‍රයාගේ හස්තයේම ස්වර්ගස්ථ වූ අතර මවගේ මරණින් පසු සියලු වස්තුව දිළිඳුන් අතර බෙදා දී හිපො නගරයට ගොස් එහිදි පූජක වරම් ලැබිය. එහිදි තාපසාරාමයක් ඉදිකළ අගුස්තීනු මුනිතුමන් පසුව රදගුරු ධුරයට ඔසවනු ලැබීය.

එහිදී එතුමාගේ වයස අවු 42 කි. තාපස දිවියට මුලපිරූ මෙතුමා තාපසාරාම ගොඩනංවා යැදුම්බර හා දේව වචනයේ සහාලේඛන ද සකස් කරන්නට සිය අනුගාමිකයන්ට මඟ පෙන්වන ලදි. සභා පඬිවරයකු ලෙස ප්‍රකට ව සිටින මෙතුමා දේශනා මඟින්ද ලියවිලි මඟින්ද එකල පැවති වේදභේදිත තර්ක රාශියක් පරාජය කළේය.

ඔහු පෙර ගත කළ පාපිෂ්ඨ ජීවිතය පිළිබඳව ඔහුගේ මතකයෙන් කිසිදාක ඉවත් නොවීය. ඒ පිළිබඳ ව ම පාපොච්චාරණය "නැමැති පොතේ කරුණු කාරණා ඉදිරිපත් කර ඇත. එමගින් මනෝවිද්‍යාත්මක ලෙස මිනිස් හදවත හා සිතුවිලි දෝලනය වන ආකාරය එතුමා මැනවින් පෙන්වා දී ඇත. එතුමන් විසින් රචිත තවත් සුවිශේෂී කෘතියක් ලෙස නම් කළ හැකිය. ශු. සභාවේ ශ්‍රේෂ්ඨ පඬිවරයකු ලෙස ශු. ත්‍රිත්වය හා අභිරහස් ලොවට ලේඛන මඟින් ඉදිරිපත් කළ ප්‍රකට සභා පිතෘවරයා ලෙස ශු. අගුස්තිනු මුනිතුමා නම් කළ හැකිය. එතුමාගේ මරණාසන්නයේදී ඇඳට ඉහලින් විශාල අත්අකුරින් ගිතාවලියේ 51 වන ගිතය ලියා නිතර දෙවේලේ එය මෙනෙහි කළ බව සඳහන් වේ. ක්‍රි.ව. 430 අගෝස්තු 28 වන දින මෙතුමා ස්වර්ග ස්ථ වූ අතර බටහිර සභා ලේඛනයන්හි පියා යන ගෞරව නාමයෙන් මෙතුමන් අමතනු ලබන්නේය.

**අසේල දසනායක**



සේයා :-
ශ්‍රියංගනී
ෆිලිෂියා

## මාසික සිතිවිල්ල

"අගෝස්තු මාසය"

ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.

මාසික
සිතිවිල්ල

# ප්‍රහේලිකා අංක 32

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | | | 2 | ■ | 3 |
| | ■ | ■ | | ■ | |
| | ■ | ■ | 4 | 5 | |
| 6 | 7 | | ■ | | ■ |
| ■ | | ■ | 8 | | |
| 9 | | | ■ | | ■ |

( සැකසුම - තිළිණි දුතිකා පෙරේරා )

හරහට

1. මෙම කාලයේදී විශේෂයෙන් ක්‍රිස්තුන් වහන්සේගේ දුක්ප්‍රාප්තිය සිහි කරනු ලබයි.

4. අන්තිම රාත්‍රී භෝජනයෙන් පසු ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන් අතරින් උන්වහන්සේ ප්‍රේම කළ තැනැත්තා උන්වහන්සේගේ .......... ළංව හාංසි වී සිටියේය මෙහි හිස්තැනට සුදුසු වචනය.

6. ක්‍රිස්තුන් වහන්සේ බොහෝ අවස්ථාවලදී මොවුන් වැහී සිටි අයට සුවය ලබාදුන් සේක.

8. ක්‍රිස්තුන් තම කන්ද උඩ දේශනයේදී ........... හා විපත පිළිබඳව විස්තර කළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

9. ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රාවකයන් අතරින් ජුදස් පොදු ............ පසුම්බිය බාරව සිටියේය මෙහි හිස්තැනට සුදුසු වචනයට සමාන වචනයකි.

පහළට

1. අල්ලස් ගැනීමෙන් මෙය දූෂණය වන බව ධර්ම දේශකයා පවසයි.

2. ක්‍රිස්තුන් වහන්සේව කුරුසියේ ඇණ ගසන පිණිස ........... පිටිය යන අර්ථය ඇති ''ගොල්ගොතා'' නම් ස්ථානයට ගෙන ගිය සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

3. ක්‍රිස්තුන් වහන්සේ කුරුසියේ ඇණ ගැසු පසු මද්දහනේ සිට අපරභාග .............. පමණ උන්වහන්සේ ''මාගේ දෙවියනි, මාගේ දෙවියනි, ඔබ මා අත්හැරියේ මන්ද?'' කියා මොර ගැසුහ. මෙහි හිසතැනට සුදුසු වචනය

5. එක් ධනවත් ප්‍රධානියෙක්, උන්වහන්සේට කථා කොට, ''............. ගුරු දේවයනි, සදාතන ජීවිතය උරුම කර ගන්නට මා කුමක් කළ යුතුදැ''යි ඇසිය. මෙහි හිස්තැනට සුදුසු වචනය

7. ජෙරමියා දිවැසිවරයාට දෙවියන් වහන්සේ මෙසේ වදාළ සේක. ''ඊශ්‍රායෙල් ජනයෙනි, .......................... කරු අතේ තිබෙන මැටි පිඬක් මෙන් නුඹලා මාගේ අතේ සිටින්නාහුය. හිස් තැනට සුදුසු වචනය.

(මෙම ප්‍රහේලිකාව පිරවීමේදි පහත සඳහන් බයිබල් පාඨ උපයෝගී කරගත හැකිය. ශු. මාක් 15/22, , ශු. ලූක් 6/ 20 , 18/18 , ශු. ජුවාම් 13/ 23 , 13 / 29 , ජෙරමියා 18 /6 , ධර්මදේශකයා 7 / 7)




මතුගම ශා. මරියා දහම් පාසලේ පළමු වතාවට ශිෂ්‍ය නායක පදක්කම් පැළඳවීම පසුගියදා සිදු කෙරිනි. මීසම් සේවක ගරු දෙව්ෂාන් අසංක පියතුමා හා ගරු පැවිදි සොයුරියන්ගේ නායකත්වය යටතේ මෙය පැවැත්වුණි.

සුනිතා මාලනි විජේසිංහ




තිබ්බටුගොඩ මීසමට අයත් ශාන්ත ජෝශප් පෙර පාසලේ දරුවන්ගේ අත්කම් භාණ්ඩ ප්‍රදර්ශනයක් පසුගියදා පැවැත්වුණි.

මෙය විවෘත කිරීමට පැමිණි තිබ්බටුගොඩ මීසම් සේවක ගරු රංජිත් ටෙරි පියතුමන් පෙර පාසලේ විදුහල්පති ගරු පැවදි සොයුරිය සමග ගුරුවරුන් එක්ව මෙසේ පිළිගන්නා ලදී. කැලිස්ටස් ඇන්ටනි



**වරාගොඩ සාන්ත පාවුලු බාලිකා මහා විද්‍යාලයේ ප්‍රාථමික සිසු දැරියන්ගේ සුරඟන තාල නර්තන ප්‍රසංගය පසුගියදා කැලණිය තෙරේසා මුණිවරියගේ මීසම් ශාලාවේදී පැවැත්වුණි.**

**මේ අවස්ථාවට එක්වූ පෞද්ගලික කතෝලික පාසල් සාමාන්‍යාධිකාරී ගරු රංජිත් මදුරාවල , සහයක ගරු නිලන්ත හේෂාන් , කැලණිය මීසම් සේවක ගරු ගිහාන් රිඩ්ලි යන පියතුමන් හා ගරු සුනිතා පැවදි සොයුරිය පිළිගත් අයුරු මෙහි දිස්වේ.**


රජ කුමාරයයි.... කිඳුරු කුමාරියයි..
කතාව:- ආනන්ද කාලිදේරා.. දෙවස්. චිත්‍ර:- ඇස්.ඒ.පී. සපුආරච්චි..
දිය කිඳුරියන්ගෙ රාජධානියේ හිටියා නපුරු බලසම්පන්න මායාකාරියක්... එයා කොච්චර නපුරු වුනත්.. එයාගෙ දුව හරිම කරුණාවන්තයි..! කුමාරිටත් හරිම ආදරෙයි.. කුමාරි එදා උදේ ඉඳන්ම එයාව හම්බවෙන්න ගියා..!
12
මුහුද පතුලෙ විශාල ගල්පරයක් යට තමයි.. එයාගෙ ගේ තියෙන්නෙ... ඒක නම් සැරි විමානයක්.. ඇට සැකිලි හැම තැනම..! කැඩුන නැව් වල කෑලි වලින් තමයි ඒක හදල තියෙන්නෙ..
මේව දැක්කම කුමාරිට බයත් හිතුණා.. ඒ වුනාට කුමාරය ගැන හිතුනම.. ඒ බය නැති වෙලා යනවා..!
මායාකාරියගෙ දුව ඇවිත් කුමාරිව පිළිගත්තා හොඳ වෙලාවට මායාකාරිය විමානයෙන් පිට වෙලයි හිටියෙ..! කුමාරි සියලු විස්තර යාලුවට කිව්වා..
කොහොම හරි මට කුමාරයව හොයාගන්න උදව් කරන්න..
අද අම්මත් නෑ.. ඔයා හොඳ වෙලාවටයි ආවෙ..
යාලුවට හරියට දුක හිතුනා..! එයා මායාකාරියගෙ මායා කැඩපත ළඟට කුමාරිව එක්කරගෙන ගියා..! කැඩපත දිහා බලාගෙන මොනවද මතුරන්න පටන් ගත්තා
माया दरपन..! माया दरपन..! मद्दा समुद्र दे ऐक तैंका कट्टां दे राज कुमार दिखाओ
අපි බලමු මොකද වෙලා තියෙන්නෙ කියලා.
කැඩපත එකපාර වම දිලිසෙන්න පටන් ගත්තා.. ඊට පස්සෙ ටික ටික මුහුද පේන්න ගත්තා. නැව තිබුනු තැනක් වත් නෑ..! මුදෙ හැම තැනම නැවේ කෑලි පාවෙමින් තිබුනා.. කැඩපත හරව හරවා බැලුවා.. ඔහොම බලනකොට ඈත මුහුදෙ මොකක්දෝ..
ගුලියක් වගේ දෙයක් පාවෙනව දැක්කා කැඩපත තිවත් ළං කරල බලනකොට කුමාරය නැවේ කැඩුන ලී කොටයක් උඩ පාවෙනවා.. කුමාරි දැක්කා..
ඕ..කු..කුමාරය..!

**හතරවන කොටස** *දඟකාර ළමයෙකු හොඳ ළමයෙකු වූ කතාව......*

සැකසුම : තිළිණ අලහකෝන්

# නිවාඩුව

